# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 67 /2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திகதி / Date — 14/01/2024 පැය 1400

**මාධ්‍ය නිවේදනය**

**<u>පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු ජනමාධ්‍ය වෙත යොමු කිරිම.</u>**

**01. 2024.01.13 වන දින පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරින් විසින් සිදු කරන ලද නීති විරෝධී මත්පැන් වැටලීම් සම්බන්ධ වාර්තාව පහත පරිදි වේ.**

| වැටලීම් ගණන | අත්අඩංගුවට ගත් සැකකරුවන් ගණන | නීති විරෝධී මත්පැන් ප්‍රමාණය (ලීටර්) | ගෝඩා ප්‍රමාණය (ලීටර්) | වෙනත් දේපල |
|---|---|---|---|---|
| 05 | 02 | 60 | 1357 | තඹ දඟර 02<br>යකඩ බැරල් 10<br>බෝක්කා 01 |

වැටලීම් සිදුකර අත්අඩංගුවට ගන්නා ලද සැකකරුවන් හා දේපල අදාළ පොලිස් ස්ථාන වෙත ඉදිරිපත් කර ඇත.

**02. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සහ ජීව උණ්ඩ පහක් සමඟ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා කුරුණෑගල කඳවුර.**

2024.01.13 වන දින උදෑසන කාලයේදී වාරියපොළ පොලිස් වසමේ දඟයියාගල පන්සල ඉදිරිපිට ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්ය බලකා කුරුණෑගල කඳවුරේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සහ ජීව උණ්ඩ 05 ක්** සමඟ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට ගෙන වාරියපොළ පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 31 හා 38 වයස් වල පසුවන දෙමටළුව සහ සඳලංකාව ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.

වාරියපොළ පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**03.** **ගංජා පැළ සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා බුත්තල කඳවුර.**

2024.01.13 වන දින උදෑසන කාලයේදී කුඩාඔය පොලිස් වසමේ මහආර ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්ය බලකා බුත්තල කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **ගංජා පැළ 2850 ක්** සමඟ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට ගෙන කුඩාඔය පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 45 වයසේ පසුවන ඇතිලිවැව ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

කුඩාඔය පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**04.** **නීති විරෝධි මත්කරල් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට - විශේෂ කාර්ය බලකා උතුරු පළාත් විශේෂ වැටලීම් ඒකකය.**

2024.01.13 වන දින සවස් කාලයේදී තලෛමන්නාරම පොලිස් වසමේ පරණ පාලම අසල කැලෑබද ප්‍රදේශයේදී විශේෂ කාර්ය බලකා උතුරු පලාත් විශේෂ වැටලීම් ඒකකයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **නීති විරෝධි මත්කරල් 10,500 ක් සන්තකයේ තබා ගෙන සිටි** සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන තලෛයිමන්නාරම පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 39 ක් වූ තලෛමන්නාරම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

තලෛමන්නාරම පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.